සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 8 - ශ්‍රේණිය

## ඉස්ලාම් ධර්මය

**නම/විභාග අංකය :- ..........................................................** **කාලය: පැය 02 යි.**

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- පහත පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරන්න.

(01) අල්ලාහ්ගේ ඒකීභාවය සඳහන් කරන පදය,

(1) රිසාලත් (2) තව්හිද් (3) මආද් (4) ෂිර්ක්

(02) "අර්රහ්මාන්" යනු,

(1) දයාවන්තයා (2) සමාකරන්නා (3) කරුණාවන්තයා (4) රැකබලාගන්නා

(03) අල්අකුර්ආනයේ වාක්‍ය හා පරිච්ඡේද ගණන වන්නේ,

(1) 6666,07 (2) 6666,30 (3) 6699,112 (4) 6666,114

(04) සබූර් ආගම පහළ කරන ලද නබිවරයා ,

(1) දාවුද් (අලෛ) (2) මුසා (අලෛ) (3) ඊසා (අලෛ) (4) ආදම් (අලෛ)

(05) ඉබ්රාහිම් (අලෛ)තුමාගේ සුවිශේෂ නාමය වන්නේ,

(1) කලීලුල්ලාහ් (2) කලීමුල්ලාහ් (3) රූහුල්ලාහ් (4) අබුල්බෂර්

(06) ජල ගැලීමෙන් විනාශයට පත් වු නබිවරයාගේ සමාජය වන්නේ,

(1) සාලිහ් (අලෛ) (2) නුහ් (අලෛ) (3) ලූත් (අලෛ) (4) මුසා (අලෛ)

(07) ෆර්ලු කිෆායා සඳහා නිදසුනක්,

(1) ජුමුආ සලාතය (2) පස්වේල් සලාතය (3) ජනාසා සලාතය (4) විත්ර් සලාතය

(08) ජමාඅත් වශයෙන් ඉටුකළ නොහැකි සලාතයකි,

(1) ජුමුආ සලාතය (2) ග්‍රහණ සලාතය (3) ඊද් සලාතය (4) තහියියතුල් මස්ජිද්

(09) "කාතමුන් නබි" යනුවෙන් හැඳින් වු නබි වරයා,

(1) මුසා (අලෛ)තුමා (2) මුහම්මද් (සල්)තුමා (3) ඉද්රීස් (අලෛ)තුමා (4) ෂීද් (අලෛ) තුමා

(10) ආගම් හා සුහුෆ් පහළ කරනු ලැබූ නබිවරයා,

(1)ඊසා (අලෛ) තුමා (2)ඉබ්රාහිම්(අලෛ) (3) මූසා (අලෛ) (4) ජිබ්රීල් (අලෛ)

(11) සාලිහ් (අලෛ) තුමාගේ සමාජය හඳින් වූ නම,

(1) ආද් (2) උම්මත් (3) බනූඉස්රාඊල් (4) සමූද්

(12) සතුටු වූ දෙයක් හෝ ස්තුති කිරීම සඳහා ඉටු කරන සජ්දාව වන්නේ,

(1) සජ්දා සහ්වා (2) සජ්දා ෂුකුර් (3) සජ්දා තිලාවත් (4) සජ්දා සලාත්

(13) සූරා අල්මා ඌන් අල්අකුර්ආන්හි කියවන පර්ච්ඡේදය ද?

(1) 107 (2) 109 (3) 114 (4) 105

(14) "අල්ලාහ් පවසයි" යනුවෙන් සඳහන් කරන හදීසය,

(1) හදිස් නබවි (2) හදිස් කුද්සි (3) හදිස් සහීහ් (4) හදිස් හසන්

(15) "වහී ගෛරු මත්ලූව්" යනු,

(1) අල්කුර්ආන් (2) හදීස් ලරීෆ් (3) අස්සීරා (4) අල්හදීස්

(16) මි:රාජ් ගමන සිදුවූ අරාබි මස,

(1) සහර් (2) රබීඋල් ආහිර් (3) රජබ් (4)ෂ:බාන්

(17) "නාමූසුල් අ:ලම්" යනුවෙන් හැඳින්වෙන මලක්වරයා,

(1) මුන්කර් (අලෛ) (2) මාලික් (අලෛ) (3)මිකාඊල් (අලෛ)

(4) ජිබ්රීල් (අලෛ)

(18) නබි(සල්) තුමා මක්කාව සිට මදීනාවට ගිය ගමන හැඳින්වන්නේ,

(1) මි:රාජ් (2) හිජ්රත් (3) ඉස්රා (4) රිහ්ලා

(19) තමන්ගේ දේපල වලින් ඉටු කරන ෆර්ළ් වූ ඉබාදතයකි,

(1) සව්ම් (2) සදකා (3) සකාත් (4) හජ්

(20) අල්කුර්ආනය හාස්කමක් වශයෙන් ලැබූ නබිවරයා,

(1) මූසා නබි (2) නූහ් නබි (3) දාවූද් නබි (4) මුහම්මද් (සල්)තුමා

(ලකුණු 2×20 = 40)

# II කොටස

- **පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

(01) පාසල් පාදක ඇගයීම් සම්බන්ධ කර ෂහ්රු රමලාන් මාතෘකා යටතේ පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(1) ෆර්ළ් උපවාසය රකින මාසය කුමක් ද? (ලකුණු 2)

(2) රමලාන් මාසය තුළ තිබෙන සුවිශේෂී රාත්‍රිය නම් කරන්න. (ලකුණු 2)

(3) මෙම මාසය තුළ වැළකිය සිටිය යුතු දිව හා සම්බන්ධ අකුසලයන් හතරක් ලියන්න. (ලකුණු 4)

(4) රමලාන් මස අනුගමනය කළ යුතු යහපත් ක්‍රියාවන් හයක් සඳහන් කරන්න. (ලකුණු 6)

(5) ඔබ ඇගයීම් සඳහා කරුණු සොයාගත් ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ලකුණු 16)

(02) (1) සහාබාවරු දෙදෙනෙකු නම් කරන්න.

(2) ජීවිතයේ පිළිපැදිය යුතු යහ ගුණාංග හතරක් සඳහන් කරන්න.

(3) අල්ලාහ් සහ නබි(සල්)තුමා වැළැක් වූ මහා පාපයන් පහක් සඳහන් කරන්න.

(ලකුණු 2 +4+5 =11)

(03) (1) වහී හි කොටස් දෙක නම් කරන්න.

(2) ජීවිතයේ වළකා ගතයුතු දුර්ගුණාංග හතරක් සඳහන් කරන්න.

(3) ගමනකදී පිළිපැදිය යුතු පිළිවෙත් පහක් සඳහන් කරන්න.

(ලකුණු 2 +4+5 =11)

(04) (1) උම්මහාතුල් මු:මිනීන්වරුන් දෙදෙනෙකු නම් කරන්න.

(2) මව්ලූඃ වූ හදීස් බිහිවීමට හේතු වූ කරුණු හතරක් ලියන්න.

(3) ජමාඅත් වශයෙන් ඉටුකළ හැකි සලාතයන් පහක් නම් කරන්න.

(ලකුණු 2 +4+5 =11)

(05) (1) මස්ජිදයට ඇතුළුවන විට උසුරන දුආව ලියන්න.

(2) ප්‍රාර්ථනාවන් සඳහා සුදුසු කාල වේලාවන් හතරක් සඳහන් කරන්න.

(3) ප්‍රාර්ථනාවල දී පිළිපැදීමට නබි(සල්)තුමා පෙන්වා දී ඇති මාර්ගයන් පහක් සඳහන් කරන්න.

(ලකුණු 2 +4+5 =11)

(06) (1) සජ්දාහි වර්ග දෙකක් සඳහන් කරන්න.

(2) මහ්රම් වූ සිව්දෙනෙකු නම් කරන්න.

(3) අප ඉටුකළ යුතු සමාජ සේවාවන් පහක් සඳහන් කරන්න.

(ලකුණු 2 +4+5 =11)

(07) (1) ප්‍රථමයෙන් පහළ වූ වාක්‍ය හා සූරාව නම් කරන්න.

(2) නබි(සල්)තුමා ද:වා කටයුතු වලදී මුහුණ දුන් අභියෝග හතරක් සඳහන් කරන්න.

(3) නබි(සල්)තුමාගේ මි:රාජ් ගමන සම්බන්ධව වාක්‍ය පහක් ලියන්න. (ලකුණු 2 +4+5 =11)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 8 - ශ්‍රේණිය

## ඉස්ලාම් පිළිතුරු

**I කොටස**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (06) | 2 | (11) | 4 | (16) | 3 |
| (02) | 3 | (07) | 3 | (12) | 2 | (17) | 4 |
| (03) | 4 | (08) | 4 | (13) | 1 | (18) | 2 |
| (04) | 1 | (09) | 2 | (14) | 2 | (19) | 3 |
| (05) | 1 | (10) | 3 | 15) | 4 | (20) | 4 |

(ලකුණු 2 × 20 = 40)

**II කොටස**

(01) (1) රමළාන් (ලකුණු 2)

(2) ලෛලතුල් කද්ර් (ලකුණු 2)

(3) බොරු කීම, අනවශ්‍ය දේවල් කථා කිරීම, විහිළු කිරීම, කේලම් කීම, අපවාද කීම (ලකුණු 4)

(4) උපවාසයේ යෙදීම, අල්කුර්ආන් පාරායනය, ඉ:තිකාෆ් සිටීම, දන්දීම, තව්බා කිරීම,
දුආ කිරීම, තරවීහ් (ලකුණු 6)

(5) ඉස්ලාම් පෙළ පොත, ගුරුභවතාගෙන්, දෙමාපියන්ගෙන්, යහලුවන්ගෙන් (ලකුණු 2)

(02) (1) බිලාල් (රලි), අබ්දුර් රහ්මාන්(රලි), උමර්(රලි), උස්මාන්(රලි)..... (ලකුණු 2)

(2) දේව භක්තියෙන් ජීවත් වීම, පොරොන්දු ඉටු කිරීම, ඇත්ත කථා කිරීම, සාමය ප්‍රිය කිරීම, ඉවසීම (ලකුණු 4)

(3) අල්ලාහ්ට සම කිරීම, හූනියම් කිරීම, ඝාතනය කිරීම, පොළිය, අනාථයන්ගේ දේපළ භුක්ති විඳීම (ලකුණු 5)

(03) (1) වහිමත්ලුව්, වහීගෙරු මත්ලුව් (ලකුණු 2)

(2) බොරු කීම, ආඩම්බර වීම, ඊර්ෂ්‍යා කිරීම, දොස් කීම, වංචා කිරීම (ලකුණු 4)

(3) *පිරිසිදු ජේතනාව *අදහස් යෝජනා ලබා ගැනීම
*ණය ගෙවා දැමීම *අවශ්‍ය දේ රැගෙන යාම
*නායකයකු පත් ක්රීම *අදාළ දුආ ප්‍රාර්ථනා උසුරීම (ලකුණු 5 )

(04) (1) කදීජා (රලි), සෛනබ් බින්ත් ජහ්ෂ් (රලි),උම්මු සල්මා (රලි), ආයිෂා (රලි) (ලකුණු 2)

(2) දේශපාලන අරමුණු, ඉපයීම උදෙසා කතා කියන්නන්,
රාජ්‍ය පාලකයන්ගේ පඬුරු ලබා ගැනිම
ප්‍රසිද්ධිය ලබා ගැනීමට
ප්‍රාදේශිකත්වය උසි ගැන්වීමට (ලකුණු 4)

(3) *පිරිසිදු ජේතනාව *අදහස් යෝජනා ලබා ගැනීම

(3) •ජුම්මා සලාතය •ඊද්දින සලාතයන්

•ග්‍රහණ සලාතය •තරාවීහ් සලාතය

•ජනාසා සලාතය •පස්වේල් සලාතය (ලකුණු 5)

(05) (1) අල්ලාහුම්මෆ්තහ්ලී අබ්වාබ රහ්මතික (ලකුණු 2)

(2) තහජ්ජුත් වේලාව, සිකුරාදා දින, රමළාන් මාසය, අරෆා දින (ලකුණු 4)

(3) වුලු:සමග ප්‍රාර්ථනා කිරීම, කිබ්ලාව පෙරටු කොට දෑත් ඔසවා හම්ඳු සලවාත් සමග ආරම්භ කිරීම, ඉල්ලන කරුණ තෙවරක් ඉල්ලීම (ලකුණු 5)

(06) (1) සජ්දා තිලාවත්, සජ්දා ෂුක්ර්, සජ්දා සහ්වා (ලකුණු 2)

(2) මව, දියණිය, පියාගේ සහෝදරිය, මවගේ මව (ලකුණු 4)

(3) රෝගීන්ට උදව් කිරීම, කුසගින්නේ සිටින අයට ආහාර ලබා දීම, හානියට පත් වූ අයට උදව් කිරීම, දුප්පතුන් අනාථයන් රැකබලා ගැනීම (ලකුණු 5 )

(07) (1) ඉක්ර: , සූරා අල් අලක් (ලකුණු 2)

(2) •පිස්සා, හූනියම් කාරයා, යනුවෙන් වැරදි විදියට කථා කිරීම

•ඔටුවන්ගේ බඩවැල් කරේ දමූහ, පහර දී තුවාල සිදු කළහ

•නබි(සල්)තුමාගේ අනුගාමිකයන් හිංසනයට පත් කළහ. (ලකුණු 4)

(3) •මක්කාවේ සිට අක්සාව ගොස් අල්ලාහ් ගාව ගිය ගමන මි:රාජ්වේ

•නබි(සල්)තුමා තමන්ගේ 52 වියේ දී ගියහ.

•බුරාක් නම් වාහනයේ ගියහ

•අහසේ නබිවරුන් මුණ ගැහුන හ.

•සලාතය තෑගි වශයෙන් ලබා දෙන ලදී. (ලකුණු 5)